**ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය - 2019**

**------------------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**---------------------------------**

ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආරක්ෂක විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**--------------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ආරක්ෂක විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආරක්ෂක විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආරක්ෂක විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආරක්ෂක විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වා ගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශික්ෂණ රෝහල සඳහා 2017 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු. මිලියන 681.86 ක් වටිනා ගෘහ භාණ්ඩ, ලී බඩු හා සවිකිරීම් යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට අනෙකුත් වත්කම් යටතේ ගිණුගත කර තිබීම නිසා 2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ක්ෂය වෙන්කිරීම් රු. මිලියන 96.17 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වත්කම් වර්ගය නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු අතර ගිණුම් ප්‍රතිපත්ති අනුව ක්ෂය ගණනය කල යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ආරක්ෂක විශ්වවිද්‍යාලය තුල පවත්වා ගෙන යනු ලබන සමාජ ශාලාව, බේකරිය ,ජන අවන්හල සහ ආපන ශාලාව විසින් සමාලෝචිත වර්ෂය තුලදී එකතුව රු. මිලියන 6.47 ක ලාභයක් උපයා තිබුණද එය විශ්වවිද්‍යාලයේ ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශන තුල හඳුනා ගෙන නොතිබුණි. | ආදායමෙන් කොටසක් ඉදිරියේදී ස්වයං මූල්‍ය අරමුදල වෙත ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | විශ්ව විද්‍යාලය තුල උපයන ආදායම් විශ්ව විද්‍යාලයේ ආදායම් ලෙස හඳුනාගත යුතුය. |
| (ඇ) එකතුව රු.මිලියන 66.82 ක් වූ සෘජු තැන්පතු, ආදායම් ලෙස හඳුනා ගැනීමකින් තොරව මූල්‍ය තත්ව ප්‍රකාශනය තුල ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි. | ආදායමක් ලෙස හඳුනා ගැනීමට ක්‍රියා කරනු ලැබේ. | හඳුනා නොගත් විවිධ තැන්පතු හඳුනාගෙන අදාල ආදායම් යටතේ ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයට අදාල එකතුව රු. මිලියන 18.37 ක් වූ උපචිත වියදම් ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම් පිළියෙල කිරීමේදී එම තොරතුරු ලැබී නොතිබුණු අතර ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | කාල පරිච්චේදයට අදාල වියදම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට වර්ෂ 2 සිට වර්ෂ 4 දක්වා සංචලණය නොවී ඉදිරියට ගෙන එමින් තිබුණු ලැබිය යුතු වටිනාකම් 04 ක එකතුව රු. මිලියන 1.57 ක් විය. | සිසුන්ගේ ලියාපදිංචිය අවලංගු කිරීමට අදාල අනුමැතිය ලැබී නැති බැවින්ද,තව දුරටත් ලැබිය යුතු වටිනාකම් පවතින බැවින් ද ලැබිය යුතු වටිනාකම් ලෙස දක්වා ඇත. | නොපමාව අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උපචිත වියදම් යටතේ වර්ෂ 01ත් වර්ෂ 03ත් අතර රු. මිලියන 6.86 ක් සහ අනෙකුත් ණය හිමියන් යටතේ වර්ෂ 01ත් වර්ෂ 05 ත් අතර රු. මිලියන 45.08 ක් නිරවුල් නොකර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වාම පැවතුණි. | මේ වන විට නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රමාදයන්ගෙන් තොරව නිරවුල් කිරීමට පියවර ගත යුතුය. |

### 1.6.3 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව අග්‍රිමයන් නිරවුල් කිරීම හෝ ආපසු භාරදීම අග්‍රිමයන් නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පියවිය යුතු වුවත් 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා එකතුව රු. මිලියන 1.91 ක අත්තිකාරම් ගෙවීම් නිරවුල් කර නොතිබුණි. | නිරවුල් නොවූ අත්තිකාරම් මිලදී ගැනීමේ,මුදල් ,සුළු මුදල්,උත්සව අත්තිකාරම්වලින් සමන්විත වන බව සහ අත්තිකාරම්වලට අදාලව කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර තිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) 1981 අංක 68 දරන ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතන පනත සහ 1988 අංක 27 හා 2007 අංක 50 දරන සංශෝධන පනත | විශ්වවිද්‍යාල ආයතනය සඳහා නිලධාරීන් ඇතුලත් කර ගැනීමට බලය ඇත්තේ ත්‍රිවිධ හමුදාවට අවශ්‍ය කැඩෙට් නිලධාරීන් වුවත්, 2011 වර්ෂයේ සිට මුදල් ගෙවීමේ පදනම මත දේශීය හා විදේශීය සිසුන් ඇතුලත් කර ගෙන තිබුණද ඒ සඳහා බලය පැවරෙන පරිදි පනත් සංශෝධනය කර ගෙන නොතිබුණි. | කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු ආරක්ෂක අමාත්‍යංශය හරහා සිදු කරමින් පවතියි. | විශ්වවිද්‍යාල පනත් කෙටුම්පත නොපමාව අනුමත කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) ඖෂධවේදී උපාධි පාඨමාලාව හැදැරීම සඳහා බඳවා ගන්නා ශිෂ්‍යයින් සමග ඇති කර ගන්නා ගිවිසුමේ 07(ඒ) වගන්තිය | උපාධිය සම්පූර්ණ කළ පසු වසර 05 ක් විශ්වවිද්‍යාලයේ ශික්ෂණ රෝහලට සේවය සපයන බවටත් නොඑසේනම් බැඳුම්කර වටිනාකම ලෙස රු.මිලියන 1.05 ක මුදලක් ගෙවන බවටත් ගිවිසුම් ගතවී තිබුණ ද පාඨමාලාව සම්පූර්ණ කළ ශිෂ්‍යයින් 20 දෙනෙකු සේවය ලබා නොදී පිටව ගොස් තිබුණි. එසේ වුවද ගිවිසුම් ප්‍රකාරව රු. මිලියන 21.50 ක් අය කර ගැනීමට වාර්තාවේ දිනය දක්වා කටයුතු කර නොතිබුණි. | අදාල සිසුන්ට නිතීමය පියවරයන්හි මූලික අදියර වශයෙන් ශිෂ්‍යයින්ට හා ඔවුන්ගේ ඇපකරුවන්ට අදාල බැඳුම්කර ගෙවීමට දැනුම් දීමේ ලිපි යැවීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතියි. | ගිවිසුම් ප්‍රකාරව අදාල පුද්ගලයන් දැනුවත් කරමින් අය කර ගැනීම් සිදු කිරීමට ක්‍රියා කිරීම සහ ප්‍රතිචාර නොදක්වන අය සම්බන්ධව සුදුසු නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) විශ්වවිද්‍යාලය සහ එහි අධ්‍යයන කටයුතු සිදුකරනු ලබන විදේශීය සිසුන් සමග ඇති කර ගන්නා ගිවිසුමේ 3(ජී) වගන්තිය | සිසුන්ගේ ආහාර හා නවාතැන් පහසුකම් සඳහා ගෙවීම් සිදුකිරීම සෑම මාසයක් අවසානයේදීම සිදු කල යුතු වුවද අධ්‍යයන කණ්ඩායම් අංක 30 සිට 36 දක්වා සිසුන් 76 දෙනෙකු 2014 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා රු.මිලියන 7.25 ක මුදලක් ගෙවා නොතිබුණි. | ඉදිරියේදී අදාල වටිනාකම් අය කර ගැනීමට ක්‍රියා කරනු ලැබේ. | ගිවිසුම් ප්‍රකාරව අදාල පුද්ගලයන් දැනුවත් කරමින් අය කර ගැනීම් සිදු කිරීමට ක්‍රියා කිරීමට සහ ප්‍රතිචාර නොදක්වන අය සම්බන්ධව සුදුසු නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2 මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු. මිලියන 203.71 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේදී ඌණතාවය වූ රු. මිලියන 2,079.81 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 1876.10 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ ප්‍රදාන වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

--------------------------

**(අ) යෙදූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභය**

2018 වර්ෂය සඳහා යෙදූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභය සියයට සෘණ 4.20 ක් වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එය සියයට සෘණ 0.43 ක් වී තිබුණි.

**(ආ) ජංගම අනුපාතය**

2018 වර්ෂයේදී ජංගම වත්කම්වලට ජංගම වගකීම් අනුපාතය 1.9:1 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දී 2.6:1 ක් විය.

**(ඇ) තෝලන අනුපාතය**

2018 වර්ෂයේදී ස්කන්ධ ප්‍රාග්ධනයට ණය ප්‍රාග්ධනයේ අනුපාතය 3.5:1 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එය 3.7:1 ක් වී තිබුණි. ඒ අනුව ආයතනය සම්බන්ධව අධි තෝලන තත්ත්වයක් පැවති බව නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා මිලදී ගත් වටිනාකම රු. මිලියන 13.25 ක්, ඇ.එ.ජ. ඩොලර් 58,120 ක්, බ්‍රිතාන්‍ය පවුම් 9,456 ක් හා යුරෝ 4,212 ක් වූ වෛද්‍ය උපකරණ වර්ග 70 කට අදාලව ඒකක 1,386 ක් නිකුත් කිරීමකින් තොරව 2020 ජුලි 03 දින වන විටත් රෝහලේ වෛද්‍ය උපකරණ ගබඩාව තුල පැවතුණි. ඉන් අයිතම 16 කට අදාල ඒකක 159 ක් හා වටිනාකම රු.මිලියන 8.90 ක් වූ වෛද්‍ය උපකරණවල වගකීම් කාලය ඉකුත් වී තිබුණි. | ඉදිරියේදී ආරම්භ කිරීමට නියමිත වාට්ටු/ ඒකක වෙත නිකුත් කිරීමට තබා ගැනීම හා රෝහලේ හදිසි අවශ්‍යතාවයකදී ලබා ගැනීම සඳහා තබා ගැනීමටත් ආදී හේතු නිසා ගබඩාව තුල තබා ඇත. | රෝහල සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය කඩිනමින් බඳවා ගෙන සැලසුම්කළ වාට්ටු හා ඒකකයන් නොපමාව ආරම්භ කර ඒ සඳහා මිලදී ගෙන ඇති උපකරණ භාවිතයට ගැනීමට ක්‍රියා කල යුතුය. |
| (ආ) දක්ෂිණ මණ්ඩපය සහ විශ්වවිද්‍යාලීය ශික්ෂණ රෝහල යටතේ ඉඩම් සංවර්ධනය වෙනුවෙන් එකතුව රු. මිලියන 1,245.69 ක් සහ දක්ෂිණ මණ්ඩපයේ නේවාසිකාගාර ඉදිකිරීම වෙනුවෙන් රු. මිලියන 399.20 ක් වැය කර තිබුණද ඊට අදාල ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගෙන නොතිබුණි. | පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් ඇත. | ඉඩම්වල හිමිකාරීත්වය පවරා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඇමරිකන් එක්සත් ජනපද ඩොලර් මිලියන 177.329 ක් සහ රුපියල් මිලියන 3,165.821 ක් වූ ණයක් ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ලබා ගෙන ඉදිකර තිබුණු රෝහල 2017 මැයි මාසයේදී නිල වශයෙන් විවෘත කර රෝහල මෙහෙයුම් කටයුතු 2017 දෙසැම්බර් මාසයේදී ආරම්භ | සරිලන පරිදි කාර්ය මණ්ඩලය හා වෛද්‍ය උපකරණ නොමැතිවීම හේතුවෙන් මෙහෙයුම් කටයුතු ආරම්භකර නොතිබුණු අතර අවශ්‍ය බඳවා ගැනීම්කර මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරනු ලැබේ. | අවශ්‍ය මානව සම්පත් සහ භෞතික උපකරණ සපයා ගෙන මෙහෙයුම් ආරම්භ කිරීමට ක්‍රියා කළ යුතුය. |

| | | |
|---|---|---|
| කර තිබුණි. විශ්වවිද්‍යාලීය ශික්ෂණ රෝහල තුල ස්ථාපිත ඒකක 05 ක් සහ පස්වන මහලේ වෛද්‍ය වාට්ටු 2019 දෙසැම්බර් 31 දින දක්වාම ආරම්භ කර නොතිබුණි. | | |
| (ආ) 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා විශ්වවිද්‍යාලයට ඇතුලත් වූ විදේශීය සිසුන් ප්‍රමාණය 44 සිට 29 අතර පරාසයක වූ බැවින් විදේශීය සිසුන් ඇතුලත් වීමේ අඩු ප්‍රවනතාවයක් පැවති බව නිරීක්ෂණය විය. | විදේශීය සුදුසුකම් මත සිසුන් බඳවා ගැනීම සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් කළමනාකරණ මණ්ඩලය මගින් (569:26) අනුමත කර ඇත. | විදේශීය සිසුන් ඇතුලත් නොවීමට හේතු සොයා බලා ඒ සඳහා පියවර ගත යුතුය. |
| (ඇ) ශික්ෂණ රෝහල තුල ක්‍රියාත්මක වූ සායන 16 කින් ඉදිරිපත් කළ තොරතුරුවලට අනුව 2019 වර්ෂය සඳහා සායන ප්‍රතිකාර ලබාදිය හැකි රෝගීන් ප්‍රමාණය 111,800 ක් වුවත් ප්‍රතිකාර ලබා දී තිබුණු ප්‍රමාණය 65,203 ක් වුයෙන් පවතින සම්පත් ධාරිතාවයෙන් සියයට 42ක් උපයෝජනය කර නොතිබුණි. | වෛද්‍යවරුන්ගේ මෙන්ම කනිෂ්ඨ කාර්යය මණ්ඩලයේ හිඟතාවයන් මේ සඳහා හේතු විය. | පවතින සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ඉ) 2019 වර්ෂයේදී නේවාසික ප්‍රතිකාර සඳහා පැවති ඇඳන් 359 ක් වූ ඇඳන් ධාරිතාවයෙන් උපයෝජනය සියයට 27 ක් වැනි පහල අගයක් ගෙන තිබුණි. | 2019 වර්ෂයේදී වාට්ටු අංක 09 විවෘත කර නොතිබීම වෛද්‍ය හා කාර්ය මණ්ඩල හිඟතාවය නිසා සහ සියලුම වෛද්‍ය උපකරණ ස්ථාපිතව නොතිබීම හේතුවෙන් ක්‍රියාකාරීත්වය අවම වීමට හේතු වී තිබුණි. | වෛද්‍ය හා අනෙකුත් කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සම්පූර්ණ කර රෝහල් මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඊ) 2019 පෙබරවාරි 12 දිනැති අංක 04/2019 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ චක්‍රලේඛ විධිවිධාන පරිදි වෛද්‍ය පීඨය, ඉංජිනේරු පීඨය, නීති පීඨය, නිර්මිත පරිසර හා අවකාශීය පීඨය සහ පරිගණක පීඨය සඳහා ආචාර්යවරයෙකු සඳහා සිටිය යුතු ශිෂ්‍ය ප්‍රමාණය ඉක්මවා පිළිවෙලින් 14,10,21,04 සහ 14 බැගින් සත්‍ය සිසුන් ගණන ඉහල අගයන් ගෙන තිබුණි. | පාඨමාලා සඳහා සිටින ආචාර්ය මණ්ඩලය සහ සිසුන් ප්‍රමාණය පිළිබඳව තොරතුරු ඉදිරිපත් කර ඇත. | පාඨමාලාවල ගුණාත්මකභාවයන් ඉහල යන ආකාරයට ගැලපෙන පරිදි ගුරු සිසුන් අතර අනුපාතය පවත්වා ගෙන යාමට හැකි සෑම විටම ක්‍රියා කළ යුතුය. |

## 3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබූ එකතුව රු. මිලියන 250.31 කට අදාල විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨ ගොඩනැගිල්ල සහ විවාහක නිලධාරී නිවස්නයේ ඉදිකිරීම් කටයුතු පිළිවෙලින් 2014 සහ 2015 වර්ෂ වලදී ආරම්භ කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම ඉදිකිරීම් නිම කිරීමට අපොහොසත් වී තිබුණි. | 2020 වර්ෂයේදී ස්වයං මූල්‍ය අරමුදල යටතේ වැඩ ආරම්භ කරන බව දක්වා තිබුණි. | ව්‍යාපෘති සැලසුම් කළ දිනට නිම කරවීමට කළමණාකරණය අවධානය යොමු කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විශ්වවිද්‍යාලය තුල තනතුරු නාම 76 ක් සඳහා අනුමත කාර්යය මණ්ඩලය 903 ක් වුවද තත්‍ය කාර්යය මණ්ඩලය 754 ක් වූයෙන් පුරප්පාඩු 149 ක් විය. එසේම විශ්වවිද්‍යාලයට තාවකාලිකව අනුයුක්ත කර ඇති දකුණු ආසියානු වෛද්‍ය හා තාක්ෂණික ආයතනය සඳහා අනුමත කාර්යය මණ්ඩලය 149 ක් වුවද පුරප්පාඩු 116 ක් විය. | සුදුසුකම් සහිත අයදුම්පත් ඉදිරිපත් වීම අවම වීම,තාවකාලිකව බඳවා ගන්නා අය ඉවත්ව යාම, අපේක්ෂිත අවම අයදුම්පත් ප්‍රමාණයවත් නොලැබීම පුරප්පාඩු සඳහා හේතුවූ අතර, අවශ්‍ය බඳවා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. | කාර්යය මණ්ඩල අවශ්‍යතාවයන් නිවැරදිව සමාලෝචනය කිරීමටත් හා අවශ්‍ය බඳවා ගැනීම් කඩිනමින් සිදුකිරීමට ක්‍රියාකළ යුතුය. |
| (ආ) දක්ෂිණ මණ්ඩපයේ අධ්‍යයන කාර්යය මණ්ඩලයේ තනතුරු නාම 12 කට අනුමත කාර්යය මණ්ඩලය 154 ක් වුවද තත්‍ය කාර්යය මණ්ඩලය 56 දෙනෙකු වූයෙන් පුරප්පාඩු 98ක් විය.මහාචාර්ය, උපදේශක I ශ්‍රේණිය, පරිගණක වැඩසටහන් හා පද්ධති විශ්ලේෂක, සහ ජාල පරිපාලක යන තනතුරු සඳහා කාර්යය මණ්ඩලයට කිසිවකුත් බඳවා ගෙන නොතිබුණි. එමෙන්ම අනධ්‍යයන කාර්යය | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා 2020 වර්ෂයේදී දැන්වීම් පළකිරීමට කටයුතු කරනු ලැබේ. | කාර්යය මණ්ඩල අවශ්‍යතා කාලීනව සමාලෝචනය කර අවශ්‍ය කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට ක්‍රියා කළ යුතුය. |

| | | |
|---|---|---|
| මණ්ඩලයේ තනතුරු නාම 29 ක් සඳහා අනුමත කාර්යය මණ්ඩලය 376 ක් වුවද තත්‍ය කාර්ය මණ්ඩල 100 ක් වූයෙන් පුරප්පාඩු 276ක් විය. | | |
| (ඇ) රෝහලේ වෛද්‍ය කාර්යය මණ්ඩලය සඳහා තනතුරු නාම 58 ක් සඳහා අනුමත කාර්යය මණ්ඩලය 1,375 ක් වුවත් තනතුරු නාම 19 ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත කාර්යය මණ්ඩලය 427 ක් පමණක් බඳවා ගෙන තිබූ අතර පරිපාලන කාර්ය මණ්ඩලයේ තනතුරු නාම 77 ක් සඳහා අනුමත කාර්ය මණ්ඩලය 501 ක් වුවද තනතුරු නාම 06 ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත 32 දෙනෙකු පමණක් බඳවා ගෙන තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බඳවා ගැනීමේ කාර්යය පරිපාටීන් අනුමත වීමෙන් අනතුරුව අදාල වෛද්‍ය හා පරිපාලන කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු සිදු කරන බව දක්වා තිබුණි. | කාර්යය මණ්ඩල අවශ්‍යතා කාලීනව සමාලෝචනය කර අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට ක්‍රියාකල යුතුය. |
| (ඇ) 2019 දෙසැම්බර් 31 දින වනවිට රෝහල් කාර්ය මණ්ඩල තනතුරු නාම 08 ක් සඳහා පමණක් බඳවා ගැනීමේ පටිපාටි අනුමත කරවා ගෙන තිබුණි. | මේ වන විට කාර්ය මණ්ඩල තනතුරු 38 කට අදාල බඳවා ගැනීම් පරිපාටි සකස් කර ආරක්ෂක අමාත්‍යාංශය මගින් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කල 08 ක් අනුමත වී ඇති අතර තවත් තනතුරු 10කට අදාලව බඳවා ගැනීම් පරිපාටි පිළියෙල කරමින් පවති. | තනතුරු සඳහා අවශ්‍ය බඳවා ගැනීම් කාර්යය පටිපාටි පිළියෙල කර අදාල ආයතන සමග මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන නොපමාව අනුමත කර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශයට විගණන කාර්යය මණ්ඩලය 4 දෙනෙකු අනුයුක්තව සිටියද විශ්වවිද්‍යාලයේ කාර්යය පුළුල් වුවත් ඊට සරිලන ලෙස කාර්යය මණ්ඩලය වැඩිකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අමතර කාර්යය මණ්ඩලයක් ලබාදෙන ලෙසට ඉල්ලුම් කර ඇත. | අවශ්‍යතාවය අනුව කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

**4.2** **අයවැය පාලනය**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාල වියදම් ඒකක 06 ක අයවැය ගත වියදම සහ සත්‍ය වියදම සැසඳීමේදී සියයට 15 සිට සියයට 246 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබුණි. | 2019 අයවැය සකස් කිරීම භාණ්ඩාගාරයෙන් ලද මුදල් මත පමණක් සිදුකර ඇති බවත් සත්‍ය වියදම් දැරීම තුල ස්වයං මූල්‍ය අරමුදලින් කරන ලද වියදම්ද ඇතුලත්ව ඇත. | කාලීනව අදාල මූලාශ්‍රයන් හඳුනා ගෙන නිවැරදිව පුරෝකතනය කර අයවැය ලේඛන පිළියෙල කළ යුතුය. |